# (28) ගෘහ ආර්ථික විද්‍යාව

## ප්‍රශ්න පත්‍ර ව්‍යුහය

**I පත්‍රය - කාලය : පැය 02යි.**
වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න **50**කි. ප්‍රශ්න **සියල්ලට ම** පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු **01** බැගින් මුළු ලකුණු **50**කි.

**II පත්‍රය - කාලය : පැය 03යි.** (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10 යි.)
මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න **අටකින්** සමන්විත වේ. පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න **හයකට** පිළිතුරු සැපයිය යුතු ය.

1 ප්‍රශ්නය : කොටස් 10කින් යුතු අනිවාර්ය ප්‍රශ්නයකි. - ලකුණු $2 \times 10 = 20$

2 - 7 ප්‍රශ්න : ව්‍යුහගත/ අර්ධ ව්‍යුහගත ප්‍රශ්න - ලකුණු $16 \times 05 = 80$

II පත්‍රය සඳහා මුළු ලකුණු = 100

**ප්‍රායෝගික පරීක්ෂණය - කාලය : පැය 03යි.**
මෙම පරීක්ෂණය **A** හා **B** ලෙස කොටස් දෙකකින් සමන්විත වන අතර 12 සහ 13 ශ්‍රේණිවලට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් සකස් වේ.
ප්‍රායෝගික පරීක්ෂණය සඳහා මුළු ලකුණු 200කි.

**A** කොටස - ස්ථානීය පරීක්ෂණය (Spot test)
ප්‍රශ්න **15** කි. මේ සඳහා කාලය මිනිත්තු 30කි.
එක් ප්‍රශ්නයකට පිළිතුරු සැපයීමට ලැබෙන කාලය මිනිත්තු **දෙකකි.**
ලකුණු $4 \times 15 = 60$

**B** කොටස - ප්‍රායෝගික ක්‍රියාකාරකම් දෙකකින් සමන්විත වේ. මේ සඳහා කාලය පැය **02**යි මිනිත්තු **30**කි. ලකුණු 140 කි.

**අවසාන ලකුණ ගණනය කිරීම :**

| | | |
|---|---|---|
| I පත්‍රය | = $50 \times 2$ | = 100 |
| II පත්‍රය | | = 100 |
| ප්‍රායෝගික පරීක්ෂණය | | = 200 |
| අවසාන ලකුණ | = $400 \div 4$ | = 100 |

**I පත්‍රය**

**සැලකිය යුතුයි :**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* **නිවැරදි හෝ වඩාත් ම ගැළපෙන** හෝ පිළිතුර තෝරන්න. (විභාගයේ දී පිළිතුරු සැපයීම සඳහා බහුවරණ කඩදාසියක් සපයනු ලැබේ.)

---

**1.** මිනිසාගේ අවශ්‍යතා අනුව කළමනාකරණය කරනු ලැබූ පරිසරය,

(1) ප්‍රශස්ත ජීවන පරිසරයයි. (2) භෞතික ජීවන පරිසරයයි.
(3) සමාජ ජීවන පරිසරයයි. (4) ප්‍රසන්න ජීවන පරිසරයයි.
(5) සමාජ ආර්ථික පරිසරයයි.

**2.** පවතින ස්වාභාවික පරිසරය සියුම් ලෙස වෙනස් කිරීමෙන් කරනු ලබන නිර්මාණය කුමක් ද?

(1) දෘඪ භූ දර්ශනය (2) දෘෂ්‍ය අක්ෂ නිර්මාණය

(3) බාහිර අවකාශ නිර්මාණකරණය (4) හැඩතල නිර්මාණය

(5) සුමට භූ දර්ශනය

**3.** නිර්මාණකරණයේ දී නිර්මාණ ශිල්පියාගේ මනසේ සටහන් වන නව නිර්මාණ පිළිබඳ මූලික අදහස හඳුන්වනුයේ,

(1) අනුකූලත්වය ලෙස ය (2) සංකල්පය ලෙස ය.

(3) වටිනාකම ලෙස ය. (4) සංකල්පීය එළඹුම ලෙස ය.

(5) සන්දර්භය ලෙස ය.

**4.** වර්ණ චක්‍රයට අයත් **නොවන** වර්ණ දෙකක් වනුයේ,

(1) අළු හා සුදු ය. (2) අළු හා දම් ය.

(3) රතු හා දුඹුරු ය (4) සුදු හා තැඹිලි ය.

(5) කළු හා කොළ ය.

**5.** පහත දැක්වෙන වරණ අතුරින් ධාන්‍යවල අඩංගු කාබොහයිඩ්‍රේට් වර්ග දෙකක් වනුයේ,

(1) මෝල්ටෝස් හා පෙක්ටින් ය. (2) ඇමයිලෝස් හා ඇමැයිලොපෙක්ටින් ය.

(3) ඇමයිලෝස් හා මෝල්ටෝස් ය. (4) පෙක්ටින් හා සුක්රෝස් ය.

(5) ඇමයිලොපෙක්ටින් හා සුක්රෝස් ය.

**6.** මුං කිරිබත්වල ප්‍රෝටීන් පරිපූරණය වී ඇත. මෙම පරිපූරණය මගින් ලැබෙන ඇමයිනෝ අම්ල දෙක වනුයේ,

(1) ලයිසින් හා ට්‍රිප්ටොෆෑන් ය. (2) ට්‍රිප්ටොෆෑන් හා ලියුසින් ය.

(3) ලයිසින් හා මෙතියොනීන් ය. (4) ලියුසින් හා වැලයින් ය.

(5) වැලයින් හා මෙතියොනීන් ය.


**7.** ලිපිඩ මගින් සිරුර තුළ සිදුවන ප්‍රධාන කෘත්‍යයකි,

(1) මලබද්ධය වැළැක්වීම. (2) එන්සයිම නිෂ්පාදනය.

(3) රුධිරයේ සංඝටකයක් ලෙස ක්‍රියා කිරීම. (4) අභ්‍යන්තර ඉන්ද්‍රියයන් ආරක්ෂා කිරීම.

(5) ප්‍රතිශක්ති පද්ධතියේ නිසි ක්‍රියාකාරීත්වය.

**8.** පහත දැක්වෙනුයේ ඇමයිනෝ අම්ලයක ව්‍යුහ සූත්‍රයයි.




මෙම ඇමයිනෝ අම්ලය වනුයේ,

(1) මෙතියොනීන් ය. (2) ග්ලයිසීන් ය. (3) ඇලනීන් ය.

(4) ආර්ජිනීන් ය. (5) ට්‍රිප්ටොෆෑන් ය.

**9.** මාළුතෙල් පිළිබඳ ව කරුණු කිහිපයක් පහත දැක්වේ. මින් **සාවද්‍ය** කරුණ වනුයේ,

(1) විටමින් A හා D අඩංගු වීම ය.

(2) හෘද රෝගීන් සඳහා වඩාත් සුදුසු වීම ය.

(3) ඔමේගා 3 මේද අම්ලවලින් සරු වීම ය.

(4) ඉහල ශක්තිජනක අගයකින් යුක්ත වීම ය.

(5) කාමර උෂ්ණත්වයේ දී ඝන තත්වයේ පැවතීම ය.

**10.** පරිභෝජනයෙන් පසුව රුධිරයට ඍජුවම උරාගන්නා සහ අතිරික්තය මුත්‍රා මගින් බැහැර කරන විටමිනය කුමක් ද?

(1) විටමින් A (2) විටමින් C (3) විටමින් D (4) විටමින් E (5) විටමින් K

**11.** පහත සඳහන් ආහාර ද්‍රව්‍ය අතුරෙන් හීම් යකඩ පමණක් අඩංගු ආහාර ද්‍රව්‍ය වනුයේ,

(1) මස්, කිරි හා නිවිති ය. (2) මස්, මාළු හා බිත්තර ය.
(3) මාළු, කිරි හා ගොටුකොළ ය. (4) බිත්තර, කිරි හා තම්පලා ය.
(5) නිවිති, කිරි හා සාරන ය.

**12.** ප්‍රෝටීන් ජීර්ණයේ අන්තර් ඵල වන, ප්‍රෝටියෝස හා පෙප්ටෝන, ඩයිපෙප්ටයිඩ බවටත්, අනතුරුව ඇමයිනෝ අම්ල බවටත් බිඳහෙලන එන්සයිම දෙක පිළිවෙළින්,

(1) ට්‍රිප්සින් හා රෙනින් ය. (2) පෙප්සින් හා ට්‍රිප්සින් ය.
(3) පෙප්සින් හා පෙප්ටිඩේස් ය. (4) රෙනින් හා පෙප්ටිඩේස් ය.
(5) ට්‍රිප්සින් හා පෙප්ටිඩේස් ය.

**13.** පලතුරුවල පෝෂණ අගය හා සම්බන්ධව සිසුවෙකු විසින් ලියන ලද කරුණු කිහිපයක් පහත දැක්වේ,

A - අඩු කැලරි ප්‍රමාණයක් සිරුරට ලබා දේ.
B - ප්‍රතිඔක්සිකාරක අඩංගු ය.
C - විටමින් B සහ විටමින් D බහුල ය.
D - මැග්නීසියම් සහ යකඩ සපයයි.
E - තන්තුමය අගයෙන් යුක්ත ය.

මේ අතුරෙන් නිවැරදි කරුණු වනුයේ,

(1) A, B හා C ය. (2) A, B හා E ය. (3) B, C හා D ය. (4) B, C හා E ය. (5) C, D හා E ය.

**14.** මන්දපෝෂණයේ දී පෙන්නුම් කරන 'ක්ෂය වීම' තත්ත්වයේ දී අපේක්ෂා කළ **නොහැකි** වනුයේ,

(1) උසට සරිලන බර ය. (2) වයසට සරිලන උස ය.
(3) වයසට සරිලන බර ය. (4) බරට සරිලන උස ය.
(5) වයසට සරිලන උස හා බර ය.

**15.** සෙ.මී 150 ක් උස කිලෝ ග්‍රෑම් 62 ක් බර පුද්ගලයෙකුගේ ශරීර ස්කන්ධ දර්ශකයෙහි අගය වනුයේ,

(1) 18.5 කි. (2) 20.5 කි. (3) 22.5 කි. (4) 27.5 කි. (5) 30.5 කි.

**16.** සිරුරට කැල්සියම් වැඩිම ප්‍රමාණයක් අවශෝෂණය කර ගත හැකි වන්නේ පහත සඳහන් කුමන ආහාරය අනුභව කිරීමෙන් ද?

(1) කිරි (2) බිත්තර (3) මාළු (4) හාල්මැස්සන් (5) නිවිති

**17.** ගැඹුරු තෙලේ බැදීම හා සම්බන්ධ **සාවද්‍ය** ප්‍රකාශය මින් කුමක් ද?

(1) ඉතා ඉහළ උෂ්ණත්වයක පිසීම සිදු වේ.
(2) තාප සංක්‍රමණය සංවහනය මගින් සිදු වේ.
(3) විටමින් සුළු වශයෙන් විනාශ වීම සිදු වේ.
(4) පිසීමේ දී දුඹුරු පැහැ ගැන්වීමක් සිදු වේ.
(5) පිසීම සඳහා අසංතෘප්ත මේද යෝග්‍ය නොවේ.

**18.** ගෘහපිළි පමණක් ඇතුළත් කාණ්ඩය මින් කුමක් ද?

(1) තුවා, ලේන්සු හා රාත්‍රි ඇඳුම්
(2) මේස රෙදි, ඇඳ ඇතිරිලි හා අත්පිස්නා
(3) අත්පිස්නා, කුෂන් කවර හා ගෘහ කබා
(4) රාත්‍රි ඇඳුම්, අත් වැසුම් හා කුෂන් කවර
(5) කුෂන් කවර, ගෘහ කබා හා ඇඳ ඇතිරිලි

**19.** රෙදි මතුපිට අලංකරණ ක්‍රම අතුරෙන් ප්‍රතිරෝධක මුද්‍රණ ක්‍රම වනුයේ,

(1) අච්චු මුද්‍රණය හා බතික් කිරීම ය.

(2) ගැටපඬු කිරීම හා තිර රාමු මුද්‍රණය ය.

(3) බතික් කිරීම හා ගැටපඬු කිරීම ය.

(4) ස්ටෙන්සිල් මුද්‍රණය හා අච්චු මුද්‍රණය ය.

(5) තිර රාමු මුද්‍රණය හා ගැටපඬු කිරීම ය.

**20.** මිනිසා විසින් නිෂ්පාදනය කරනු ලබන පුනර්ජනිත කෙඳි, කෘත්‍රිම කෙඳි හා විශේෂිත කෙඳි පිළිවෙළින්,

(1) විස්කෝස්, කේසීන් හා පොලිඑතිලීන් ය.

(2) කපු, සේද හා ඇස්බැස්ටෝස් ය.

(3) ඇරමිඩ්, රෙයෝන් හා සේද ය.

(4) පොලිප්‍රොපිලීන්, කේසීන් හා විස්කෝස් ය.

(5) රෙයෝන්, පොලිප්‍රොපිලීන් හා ඇරමිඩ් ය.

**21.** කෙඳි හඳුනාගැනීම සඳහා පිළිස්සීමේ දී, ඇක්‍රිලික් කෙඳි,

(1) උණු වී පිළිස්සෙයි.


(2) සෙමින් පිළිස්සෙයි, අඟුරු මෙන් අළු ඉතිරි වේ.


(3) උණු නොවන සුළු ය.


(4) දහනය නොවී, ද්‍රව වීම හා හැකිලීම සිදු වේ.


(5) පිළිස්සී, අළු ගුලියක් ලෙස දිස් වේ.


**22.** පොලිඑස්ටර් කෙන්දක හරස් කඩෙහි, අන්වීක්ෂීය පෙනුම දැක්වෙන රූප සටහන මින් කුමක් ද?


(1)


(2)


(3)


(4)


(5)

**23.** අමුරෙදි, පෙර පිරියම් කිරීමේ ක්‍රියාවලියේ අනුපිළිවෙළ වනුයේ,



(1) විරංජනය, කැඳහරණය, මලහරණය හා කෙඳි පිළිස්සීමයි.

(2) මලහරණය, විරංජනය, කෙඳි පිළිස්සීම හා කැඳහරණයයි.

(3) විරංජනය, කෙඳි පිළිස්සීම, මලහරණය හා කැඳහරණයයි.

(4) කෙඳි පිළිස්සීම, කැඳහරණය, මලහරණය හා විරංජනයයි.

(5) කැඳහරණය, විරංජනය, කෙඳි පිළිස්සීම හා මලහරණයයි.

**24.**  

A B

ඉහත **A** හා **B** යන රූප සටහන්වලින් දැක්වෙන වියමන් ක්‍රම පිළිවෙළින්,

(1) චාම් වියමන හා ජටා වියමන ය.
(2) හරස් දාර වියමන හා චාම් වියමන ය.
(3) ජටා වියමන හා හීරි වියමන ය.
(4) හරස් දාර වියමන හා දික් දාර වියමන ය.
(5) දික් දාර වියමන හා හීරි වියමන ය.

**25.** නැනෝ තාක්ෂණය උපයෝගී කරගනිමින් රෙදි මත රිදී ආලේපයක් ඇතිකිරීම,

(1) විරංජනය කිරීමයි.
(2) සැන්ෆරයිස් කිරීමයි.
(3) ජලරෝධක නිමාවයි.
(4) සුව පහසු නිමාවයි.
(5) බැක්ටීරියා නාශක නිමාවයි.

**26.** පුද්ගලයෙක් සමග මූලික සංවාදයක් ගොඩනැගීම සඳහා මින් වඩාත් සුදුසු මාතෘකාවක් වනුයේ,

(1) දේශපාලනයයි.
(2) ආගමයි.
(3) සෞන්දර්ය හා කලාවයි.
(4) සංස්කෘතියයි.
(5) පෞද්ගලික තොරතුරුයි.

**27.** සන්නිවේදනය සම්බන්ධයෙන් මින් වඩාත් නිවැරදි ප්‍රකාශය තෝරන්න.

(1) සන්නිවේදනය ප්‍රධාන වශයෙන් වාචික සන්නිවේදනය හා අවාචික සන්නිවේදනය ලෙස කොටස් දෙකකි.
(2) මංගල දැන්වීම් සම්බන්ධ තොරතුරු ලබාගත හැකි ප්‍රධාන මාධ්‍ය වනුයේ පුවත්පත් හා සමාජ ජාලා වේ.
(3) ඇඟිලි 'V' අකුරේ හැඩයට පෙන්වීම තුලින් 'එකගතාව' පිළිබඳ අදහස් ඉදිරිපත් කරයි.
(4) ප්‍රතිචාරය ඉතා ඉක්මනින් ලබා ගත හැකි වීම වාචික සන්නිවේදනයේ ඇති වාසියකි.
(5) නවීන තාක්‍ෂණය සෑම පුද්ගලයෙකුටම පණිවුඩ හුවමාරු කිරීම පහසුකරයි.

**28.** විවිධ අවස්ථාවලට පෙනී සිටීම හා සම්බන්ධ පහත දක්වා ඇති ප්‍රකාශ සලකා බලන්න.

A - උචිත ලෙස පෙනී සිටීමෙන්, අන්තර්පුද්ගල සබඳතා වර්ධනය වේ.
B - නවීන විලාසිතා අනුව පෙනී සිටීමෙන් අන්අයගේ පිළිගැනීමට ලක් වේ.
C - අවස්ථාවට උචිත ලෙස පෙනීසිටීමෙන් පෞරුෂය පිළිබඳ ධනාත්මක හැඟීම් ඇති කළ හැකි ය.

ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වන්නේ,

(1) A පමණි.
(2) B පමණි.
(3) A හා B පමණි.
(4) A හා C පමණි.
(5) B හා C පමණි.

**29.** පහත සඳහන් ආචාර ධර්ම අතුරෙන් සමාජ ආචාර ධර්ම ගණයට අයත් වනුයේ,

(1) ගනුදෙනු කිරීමේ පාරදෘශ්‍යබව හා වැඩිහිටියන්ට ගරු කිරීම ය.
(2) ආචාරශීලීව සංවාද ගොඩනැගීම හා කුඩා දරුවන්ට පළමුව ආහාර පිළිගැන්වීම ය.
(3) හඬ නැගෙන සේ ආහාර නොගැනීම හා තොරතුරුවල රහස්‍ය බව සුරැකීම ය.
(4) ගනුදෙනු කිරීමේ පාරදෘශ්‍යබව හා තොරතුරුවල රහස්‍ය බව සුරැකීම ය.
(5) වැඩිහිටියන්ට ගරු කිරීම හා ආචාරශීලීව සංවාද ගොඩනැගීම ය.

**30.** මුදවාපු කිරි නිෂ්පාදන ක්‍රියාවලියේ දී සෑදෙන සංයෝගයක් වනුයේ,

(1) ග්ලූකෝස් ය.
(2) කාබන්ඩයොක්සයිඩ් ය.
(3) ලැක්ටෝස් ය.
(4) ලැක්ටික් අම්ලය ය.
(5) ඊතයිල් මද්‍යසාරය ය.

**31.** ස්ථූලතාවයෙන් පෙළෙන්නෙකු සඳහා වඩාත් සුදුසු ආහාර වේලකි,

(1) බත්, පරිප්පු ව්‍යංජනය, කුකුල් මස් ව්‍යංජනය, මුකුණුවැන්න මැල්ලුම, කැරට් සම්බල

(2) බත්, අල කරිය, මාළු බැදුම, බටු මෝජුව, පපඩම්

(3) බත්, කිරිකොස් මාළුව, කරවල බැදුම, බීට් ව්‍යංජනය, පිපිඤ්ඤා සම්බල

(4) බත්, වට්ටක්කා ව්‍යංජනය, සෝයා මීට් ව්‍යංජනය, බෝංචි තෙම්පරාදුව, පොල් සම්බල

(5) බත්, අළු කෙසෙල් ව්‍යංජනය, මාළු මිරිසට, ලීක්ස් තෙම්පරාදුව, ගොටුකොළ සම්බල

**32.** පෆ් පේස්ට්‍රිය සෑදීමේ දී අනුගමනය කරන ක්‍රියාවලිය මින් කුමක් ද?

(1) පිටි සහ මේද මිශ්‍ර කර, ජලය එකතු කර, හොඳින් අනාගැනීමයි.

(2) පිටි සහ මේදය එකතු කර සාදන පිටි මෝලිය ශීතකරණයේ කිහිප වාරයක් තබා අවසානයේ නැවත රෝල් කර ගැනීමයි.

(3) පිටි වලට ජලය එකතු කර සෑදෙන පිටි මෝලියට මේදය එකතු කර අනාගැනීමයි.

(4) ජලය රත් කර, මේදය එක්කර,පසුව පිටි එකතු කර, අවසානයේ බිත්තර යොදා ගැනීමයි.

(5) පිටි සහ මේදය මිශ්‍ර කර, ජලය එකතු කර සාදා ගත් පිටි මෝලිය මඳ වේලාවක් තබා පිපුනු පසු රෝල් කර ගැනීමයි.

**33.** ශ්‍රී ලංකාවේ සංචාරක ආකර්ශනයට හේතුවන යුනෙස්කෝ (UNESCO) ලෝක උරුම ගණන,

(1) 6 කි. (2) 7 කි. (3) 8 කි. (4) 9 කි. (5) 10 කි

**34.** සංචරණය නිසා සිදුවන සමාජීය බලපෑමක් වනුයේ,

(1) සත්කාරකයාගේ හා සංචාරකයාගේ ස්වයං අභිමානය වර්ධනය වීමයි.

(2) ඍජු හා වක්‍ර බදු මගින් රජයේ ආදායමට දායකත්වය සැපයීමයි.

(3) යටිතල පහසුකම් සඳහා කරනු ලබන ආයෝජනය වැඩිවීමයි.

(4) අභ්‍යන්තර යොමුගත සංචරණය මගින් විදේශ විනිමය ඉපයීමයි.

(5) ඍජු හා වක්‍ර රැකියා අවස්ථා වැඩිවීමයි.

**35.** 'රූ දෙස් සංචරණය' යනුවෙන් හඳුන්වනුයේ,

(1) ශුද්ධ හෝ වන්දනීය ස්ථාන කෙරෙහි භක්තිමත්ව යාමයි.

(2) විස්මය දනවන වික්‍රමාන්විත ක්‍රියාකාරකම් සඳහා සංචරණයේ යෙදීමයි.

(3) භූ දර්ශන හා වනජීවීන් ඡායාරූපකරණය සඳහා සංචරණයේ යෙදීමයි.

(4) පාරිසරික සංරක්ෂණයට දායක වෙමින් කරනු ලබන සංචරණයයි.

(5) වෛද්‍ය පහසුකම් ලබා ගැනීමේ අරමුණින් සංචරණයේ යෙදීමයි.

**36.** පහත දැක්වෙන ස්ථාන අතුරෙන් සංචාරකයන්ගේ ආකර්ෂණයට හේතුවන ශ්‍රී ලංකාවෙහි මානව පාලිත ආකර්ශනයක් වනුයේ,

(1) සිංහරාජ වනාන්තරය ය. (2) හුම්මානය ය.

(3) උණු දිය උල්පත් ය. (4) හුණු ගල් ගුහා ය.

(5) ගාලු කොටුව ය.

**37.** විදුලි උපකරණ භාවිතය හා සම්බන්ධ කරුණු කිහිපයක් පහත දැක්වේ.

A - සූත්‍රිකා බල්බ වෙනුවට ආලෝක විමෝචක ඩයෝඩ (LED) බල්බ භාවිත කිරීම.

B - ජලය රත්කර ගැනීම සඳහා ගිල්ලුම් තාපකයක් වෙනුවට තාපන ඵලකයක් භාවිත කිරීම.

C - සිවිලිම් විදුලි පංකා වෙනුවට මේස විදුලි පංකා භාවිතය.

ඉහත කරුණු අතුරින් ගෘහීය භාවිතය සඳහා වඩාත් සුදුසු වනුයේ,

(1) A පමණි. (2) B පමණි. (3) C පමණි. (4) A හා C පමණි. (5) B හා C පමණි.

**38.** ගෘහස්ථ ජල පරිභෝජනය පිළිබඳ වඩාත් නිවැරදි වගන්තිය තෝරන්න.

(1) පානීය ජලයේ තිබිය යුතු pH පරාසය 3.5-5.5 අතර විය යුතු ය.

(2) වැසි ජලය මගින් රෙදි සේදීමේ දී වැඩි සබන් කුඩු ප්‍රමාණයක් අවශ්‍ය වේ.

(3) මුළුතැන්ගෙයි සේදීමට යොදාගත් ජලයේ බැක්ටීරියා අධික ප්‍රමාණයක් අඩංගු ය.

(4) රෝගකාරක ක්ෂුද්‍ර ජීවීන් අඩංගු දැයි නිර්ණය කිරීමට ජලයේ ඇති ඊ-කෝලයි බැක්ටීරියා ප්‍රමාණය ගණනය කරයි.

(5) ගෘහස්ථ ජල සැපයුම් පද්ධතියක, ටැංකියට ජලය සපයන නලය පහළින් ද, ටැංකියෙන් ජලය ඉවත් කරන නළය ඉහළින්ද, පිහිටා ඇත.

**39.** පහත දක්වා ඇති උපකරණ අතුරෙන් ගෘහස්ථ පරිභෝජනයේ දී උපරිම විදුලි ශක්තියක් පරිභෝජනය කරනුයේ,

(1) තාප දීප්ත විදුලි පහන් ය.
(2) සුසංහිත ප්‍රතිදීප්ත (CFL) විදුලි පහන් ය.
(3) බ්ලෙන්ඩරය ය.
(4) රූපවාහිනිය ය.
(5) විදුලි ස්ත්‍රික්කය ය.

**40.** ජාතික විදුලි සැපයුමෙන් ගෘහයකට සැපයෙන විදුලිය පළමුවෙන් ම ගමන් කරනුයේ පහත සඳහන් කුමන උපාංගය හරහා ද?

(1) විදුලි මීටරය (Electric meter)

(2) ශේෂ ධාරා පරිපථ බිඳිනය (Residual currrent circuit braker)

(3) සිඟිති පරිපථ බිඳිනය (Miniature circuit braker)

(4) අධිධාරා පරිපථ බිඳිනය ( Overload circuit braker)

(5) ප්‍රධාන ස්විචය (Main switch)

**41.** පහත සඳහන් ස්වාභාවික සම්පත් අතුරින් පුනර්ජනනීය **නොවන** සම්පතක් වන්නේ කුමක් ද?

(1) හිරු එළිය
(2) ජෛව ස්කන්ධ
(3) සුළඟ
(4) ජලය
(5) ෆොසිල ඉන්ධන

**42.** පහත සඳහන් ආහාර අතුරෙන් අවම ආහාර පා සලකුණු (Food Foot Print) අගයක් ගන්නා ආහාරය,

(1) එළවළු ය.
(2) සොසේජස් ය.
(3) කුකුළු මස් ය.
(4) බටර් ය.
(5) බේකන් ය.

**43.** පහත දැක්වෙන ධාන්‍ය අතුරෙන් ජාන විකරණය කළ ධාන්‍ය වර්ගයක් වන්නේ කුමක් ද?

(1) පච්චපෙරුමාල්
(2) සුවඳැල්
(3) රන් සහල්
(4) කළු හීනටි
(5) කුරුළු තුඩ

**44.** 'කාබනික ගොවිතැන' පිළිබඳ වගන්ති කිහිපයක් පහත දැක් වේ.

A - අවශ්‍ය අවස්ථාවල දී, ජෛව පලිබෝධනාශක භාවිත වේ.
B - පාරිසරික ජෛව විවිධත්වයට හානි සිදු වේ.
C - දිගුකාලීන ප්‍රශස්ත අස්වැන්නක් ලබා ගත හැකි වේ.

මින් නිවැරැදි වගන්තිය/වගන්ති වනුයේ,

(1) A පමණි.
(2) B පමණි.
(3) C පමණි.
(4) A හා B පමණි.
(5) A හා C පමණි.

**45.** පුද්ගලයෙකු මානසික පීඩනයෙන් පෙළෙන විට පෙන්නුම් කරන කායික ලක්ෂණයක් **නොවන්නේ**,

(1) කෑම අරුචියයි.
(2) හිසරදයයි.
(3) ශෝකීබවයි.
(4) වෙව්ලීමයි.
(5) නින්ද නොයෑමයි.

**46.** 'හර්ලොක්' ට අනුව යොවුන් අවධියට ඇතුළත් සංක්‍රාන්ති අවධිය ලෙස හඳුන්වන වයස් සීමාව වනුයේ,

(1) අවු: 10 - 12 ය.
(2) අවු: 11 - 13 ය.
(3) අවු: 15 - 16 ය.
(4) අවු: 16 - 18 ය.
(5) අවු: 18 - 20 ය.

**47.** යොවුන් වියේ සංවර්ධනය පිළිබඳ වඩාත් නිවැරදි ප්‍රකාශය මින් කුමක් ද?

(1) චිත්තවේග මැනවින් පාලනය කරගත හැකි වීම.

(2) මුල් අවධියේ පිරිමි දරුවන් ගැහැණු දරුවන්ට වඩා වේගයෙන් වැඩීම.

(3) තර්කානුකූලව සිතමින් වාද විවාද කිරීමට ලැදියාවක් දැක්වීම.

(4) සැම විටම අන්අයගේ මත වලට ගරු කිරීම.

(5) ගතානුගතික චින්තනය අනුගමනය කිරීම.

**48.** පුද්ගලයකුගේ පෞරුෂය හා සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - පෞරුෂය පුද්ගලයාගේ අනන්‍යතාවය පෙන්නුම් කරයි.

B - පෞරුෂ වර්ධනය සඳහා ඍජුව බලපානුයේ ආරයයි.

C - පෞරුෂය පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වේ.

D - යහපත් පෞරුෂය සමාජ ඇගයීම් මත විනිශ්චය වේ.

E - පෞරුෂ වර්ධනය සඳහා බලපානුයේ කායික වර්ධනයයි.

මේවායින් නිවැරදි කරුණු වනුයේ,

(1) A, B, C ය. (2) A, C, D ය. (3) A, C, E ය.

(4) B, C, D ය. (5) C, D, E ය.

**49.** ව්‍යවසායකත්වය පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A - ව්‍යවසායකත්ව සංවර්ධනය රටක සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනික සාධක මත තීරණය වේ.

B - අනාගතය පිළිබඳ පැහැදිලි දර්ශනයක් ව්‍යවසායකයකු සතුව පවතී.

C - පුද්ගලයෙකු සතු ව්‍යවසායකත්ව ලක්ෂණ උපතින්ම ලැබෙන්නකි.

මින් නිවැරදි ප්‍රකාශය/ ප්‍රකාශ වනුයේ,

(1) A ය. (2) B ය. (3) A හා B ය. (4) A හා C ය. (5) B හා C ය.

**50.** ව්‍යාපාර සැළසුමක ඇතුළත් පියවර කිහිපයක් පහත දැක්වේ. ඒවා නිවැරදි අනුපිළිවෙළින් දක්වා ඇති පිළිතුර වනුයේ,

(1) මූල්‍ය සැලසුම්, අලෙවිකරණ සැලසුම්, නිෂ්පාදන සැලසුම් හා පරිපාලන සැලසුම් ය.

(2) නිෂ්පාදන සැලසුම්, අලෙවිකරණ සැලසුම්, මානව සම්පත් සැලසුම් හා මූල්‍ය සැලසුම් ය.

(3) මූල්‍ය සැලසුම්, නිෂ්පාදන සැලසුම්, මානව සම්පත් සැලසුම් හා අලෙවිකරණ සැලසුම් ය.

(4) මූල්‍ය සැලසුම්, අලෙවිකරණ සැලසුම්, නිෂ්පාදන සැලසුම් හා මානව සම්පත් සැලසුම් ය.

(5) අලෙවිකරණ සැලසුම්, මූල්‍ය සැලසුම්, මානව සම්පත් සැලසුම් හා නිෂ්පාදන සැලසුම් ය.

* * *

# (28) ගෘහ ආර්ථික විද්‍යාව

## II පත්‍රය

**සැලකිය යුතුයි :**

* පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **හයකට** පිළිතුරු සපයන්න.

---

**1.** (i) 'අභ්‍යන්තර අවකාශය'යන්න හඳුන්වන්න.

(ii) සමහර ගෘහස්ථ විදුලි උපකරණවලට දෙකුරු පේනු සවි කිරීමටත් ඇතැම් විදුලි උපකරණවලට තුන්කුරු පේනු සවි කිරීමටත් හේතුව කුමක් ද?

(iii) 'දුෂ්පෝෂණය' යන්න හඳුන්වන්න.

(iv) විටමින් A ඌනතාව පෙන්නුම් කරන රෝග ලක්ෂණ **දෙකක්** සඳහන් කරන්න.

(v) නිමි ඇඳුම් කර්මාන්තයේ දී භාවිත වන කැපුම් උපකරණ **දෙකක්** නම් කරන්න.

(vi) කෙඳිවල ගුණාංගයක් වන, ජල අවශෝෂකතාව අඩු හා වැඩි කෙඳි වර්ග **දෙක** බැගින් සඳහන් කරන්න.

(vii) සංවරණය යනු කුමක් ද?

(viii) අපද්‍රව්‍ය කළමණාකරණයේ දී, භාවිත වන 3R සංකල්පය හඳුන්වන්න.

(ix) පණිවුඩයක් ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමට වැදගත් වන පියවර **දෙකක්** සඳහන් කරන්න.

(x) දරුවන් තුළ ස්වසංකල්පය ගොඩනැගීම සඳහා කළ යුතු ක්‍රියාකාරකම් **දෙකක්** සඳහන් කරන්න.

(ලකුණු 2x10)

(මුළු ලකුණු 20 යි.)

**2.** (i) ගොඩනැගිලි හා නිර්මිත පරිසර නිර්මාණයේ දී සලකා බැලිය යුතු උපයෝගිතා සාධක **තුනක්** නම් කරන්න. (ලකුණු 03 යි.)

(ii) නිවාස හෝ කාර්යාල පරිශ්‍ර තුළ ශක්ති පරිභෝජනය අවම කිරීමට භාවිත කළ හැකි උපක්‍රම **තුනක්** ලියන්න. (ලකුණු 03 යි.)

(iii) ගෘහස්ථ ජල සංරක්ෂණය සඳහා උපකාරී වන යහපත් පුරුදු **පහක්** දක්වන්න. (ලකුණු 05 යි.)

(iv) නිවසේ විදුලි උපකරණ ආරක්ෂාකාරී ලෙස භාවිතා කිරීම සඳහා අනුගමනය කළ යුතු ක්‍රියාමාර්ග **පහක්** පැහැදිලි කරන්න. (ලකුණු 05 යි.)

(මුළු ලකුණු 16 යි.)

**3.** (i) ප්‍රෝටීනයක 'ජෛව විද්‍යාත්මක අගය' යනුවෙන් කුමක් අදහස් කරයි ද? (ලකුණු 03 යි.)

(ii) ගෘහ විද්‍යාගාරයේ දී ඔබට ග්ලූකෝස් සාම්පලයක් සහ කිරි සාම්පලයක් සපයා ඇත. මේවායෙහි අඩංගු ග්ලූකෝස් හා ප්‍රෝටීන් හඳුනා ගැනීම සඳහා කරනු ලබන රසායනික පරීක්ෂණය බැගින් විස්තර කරන්න. (ලකුණු 04 යි.)

(iii) සාමාන්‍ය වැඩිහිටි කාන්තාවකගේ සහ ගර්භනී මවකගේ පෝෂණ අවශ්‍යතා **හතරක්** සංසන්දනය කරන්න. (ලකුණු 04 යි.)

(iv) දරුවාට වයස අවුරුද්ද සම්පූර්ණ වන විට පවුලේ සාමාන්‍ය ආහාර හඳුන්වා දීම වැදගත් ය. මෙය සිදුකළ යුතු ආකාරය විස්තර කරන්න. (ලකුණු 05 යි.)

(මුළු ලකුණු 16 යි.)

**4.** (i) 'ආහාර පැසීම' හඳුන්වන්න. (ලකුණු 03 යි.)

(ii) කිරි මුදවීම සඳහා යොදා ගන්නා බැක්ටීරියා විශේෂය නම් කරන්න. එම බැක්ටීරියා විශේෂය මගින් මුදවපු කිරි නිෂ්පාදනය වන අයුරු ගැලීම් සටහනකින් දක්වන්න. (ලකුණු 04 යි.)

(iii) ජෑම් සෑදීමේ ක්‍රියාවලියට අදාළ පරිරක්ෂණ උපක්‍රම හා ඒවාට අදාල මූලධර්ම පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(iv) සුළු පරිමාණ ව්‍යාපාරයක් ලෙස ජෑම් නිෂ්පාදනය කිරීමට අදහස් කරන්නේ නම් මෙම ආහාරය වෙළෙඳපොළට ඉදිරිපත් කිරීමට ව්‍යවසායකයෙකු ලෙස වෙළඳපොළ ජය ගැනීම සඳහා කළ යුතු සැලසුම් විස්තර කරන්න. (ලකුණු 05 යි.)

(මුළු ලකුණු 16 යි.)

**5.** (i) නිමි ඇඳුම් කර්මාන්තයේ දී යොදා ගන්නා විවිධ වාණිජ මැහුම් ක්‍රම **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි.)

(ii) නිමි ඇඳුම් කර්මාන්ත ශාලාවක සිදුකෙරෙන නිෂ්පාදන ක්‍රියාවලියේ විවිධ පියවර **හයක්** සඳහන් කරන්න. (ලකුණු 03 යි.)

(iii) කෙටි සායෙහි, පතරොම නිර්මාණය කිරිමට අවශ්‍ය මිනුම් පහත දැක්වේ.

උකුල මිනුම සෙ.මී. 93

උකුල් එල්ලය සෙ.මී. 21.5

සායෙහි උස සෙ.මී. 55

ඉහත මිනුම් ගණනය කර පතරොම නිර්මාණය කිරීමට අවශ්‍ය රාමුව ගොඩනගන්න. (ලකුණු 05 යි.)

(iv) කෙටි සාය මැසීමේ පියවර අනුපිළිවෙළින් දක්වන්න. (ලකුණු 05 යි.)

(මුළු ලකුණු 16 යි.)

**6.** (i) 'හරිතාගාර ආවරණය' යනු කුමක් ද? (ලකුණු 02 යි.)

(ii) හරිතාගාර ආවරණය වේගවත් කිරීම සඳහා හේතුවන මිනිස් ක්‍රියාකාරකම් මොනවා ද? (ලකුණු 04 යි.)

(iii) සංචාරක කර්මාන්තය පරිසරයට ඇති කරනු ලබන අහිතකර බලපෑම් විස්තර කරන්න. (ලකුණු 04 යි.)

(iv) හරිත පාරිභෝගිකයා, පරිසරයට සිදුවන හානි අවම කිරීම සඳහා ක්‍රියාකරන්නෙකි. හරිත පාරිභෝගිකයෙක් තුළ දැකිය හැකි ලක්ෂණ **තුනක්** පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(මුළු ලකුණු 16 යි.)

**7.** (i) නව යොවුන් වියේ දරුවන් මුහුණ දෙන අධ්‍යාපන හා වෘත්තීය ගැටලු **දෙක** බැගින් උදාහරණ දක්වමින් පැහැදිලි කරන්න. (ලකුණු 04 යි.)

(ii) නව යොවුන් වියේ පසුවන දරුවන් මුහුණ දෙන ගැටලුවලට ඵලදායී විසඳුම් ලබා දීමට අන්තර්පුද්ගල සම්බන්ධතා වැදගත් වන්නේ කෙසේ දැයි පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(iii) නව යොවුන් වියේ මනා පෞරුෂ වර්ධනය කෙරෙහි චිත්තවේගී සමබරතාව බලපාන අයුරු පැහැදිලි කරන්න. (ලකුණු 06 යි.)

(මුළු ලකුණු 16 යි.)

**8.** පහත දැක්වෙන මාතෘකා අතුරෙන් **හතරක්** පිළිබඳව කෙටි සටහන් ලියන්න.

(i) බාහිර අවකාශ නිර්මාණකරණයේ දී සලකා බැලිය යුතු කරුණු

(ii) දියවැඩියා රෝගයෙන් පෙළෙන්නෙකු සඳහා ආහාර වේල් සැළසුම් කිරීම

(iii) කෘත්‍රිම කෙඳි නිෂ්පාදනය හා සම්බන්ධ ද්‍රව්‍යායන කැටීම

(iv) සංචාරක කර්මාන්තයේ කාලීන ප්‍රවණතා

(v) පෞරුෂ සංවර්ධනය කෙරෙහි බලපාන පාරිසරික සාධක

(ලකුණු 4x4 = 16)

* * *

# (28) ගෘහ ආර්ථික විද්‍යාව

## ප්‍රායෝගික පරීක්ෂණය

මෙම පරීක්ෂණය A හා B ලෙස කොටස් දෙකකින් සමන්විත වන අතර 12 සහ 13 ශ්‍රේණිවලට අදාළ ප්‍රායෝගික ක්‍රියාකාරකම් ඇසුරින් සකස් වේ.

**A කොටස - ස්ථානීය පරීක්ෂණය**

ස්ථානීය සැකසුම් 15කින් සමන්විත ස්ථානීය පරීක්ෂණයකි. ස්ථානීය පරීක්ෂණය සඳහා යෝජිත නිදර්ශකය/නිදර්ශක ස්ථාන 15 ක නියමිත පරිදි අනුපිළිවෙළින් තබා, එම ස්ථාන 15 ට අදාළ පහත සඳහන් ප්‍රශ්න 15 සඳහා පිළිතුරු සැපයිය යුතුය. එක් ස්ථානීය ප්‍රශ්නයකට මිනිත්තු **දෙක** බැගින් මිනිත්තු 30ක් ලැබේ. ස්ථානීය ප්‍රශ්නයක් සඳහා ලකුණු **හතර** බැගින් A කොටසට ලකුණු 60ක් හිමි වේ.

- **සපයා ඇති ස්ථානීය නිදර්ශකය/ නිදර්ශක ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට සපයා ඇති තිත් ඉරි මත පිළිතුරු සපයන්න.**

**ස්ථානය 1**

(i) උසස් බව සහ ගෞරවනීය බව යන හැඟීම් ඇතිවන පරිදි මෙම පටි පිහිටුවිය හැකි ආකාරය රූප සටහනකින් දක්වන්න.

(ලකුණු 04යි)

**ස්ථානය 2**

(a) සපයා ඇති නිදර්ශක අතරින් නාන කාමරයේ බිම ඇතිරීම සඳහා සුදුසු නිදර්ශකයේ අක්ෂරය ලියන්න.
.................................................................................................................... (ලකුණු 02යි)

(b) එසේ තෝරා ගැනීමට හේතුව සඳහන් කරන්න.
.................................................................................................................... (ලකුණු 02යි)

**ස්ථානය 3**

(a) A, B හා C නිදර්ශක නම් කරන්න.
A ..................................... B ..................................... C ................................... (ලකුණු 02යි)

(b) සුවඳ තුනපහ කුඩු මිශ්‍රණයක් සැකසීම සඳහා මීට අමතරව එකතු කළහැකි ද්‍රව්‍ය දෙකක් ලියන්න.
(i) ...................................................................... (ii) ................................................................ (ලකුණු 02යි)

**ස්ථානය 4**

(a) පිසගත් ආහාර සාම්පලය, හඳුනාගෙන නම් කරන්න.
.................................................................................................................... (ලකුණු 02යි)

(b) පිසීමේ දී මෙම ආහාරයේ සිදු වී ඇති වෙනස්කම් **දෙකක්** ලියන්න.
(i) ...................................................................... (ii) ................................................................ (ලකුණු 02යි)

**ස්ථානය 5**

(a) මෙම ආහාරයේ මතුපිට පෘෂ්ඨයෙහි දිලිසෙන සුළු දුඹුරු පැහැය ඇති කිරීමට හේතු වූ ක්‍රියාවලිය කුමන නමකින් හැඳින්වේ ද?
.................................................................................................................... (ලකුණු 02යි)

(b) මෙම ස්වභාවය ඇති කිරීමට සැකසීමේ දී ආලේප කළ ද්‍රව්‍යය කුමක්ද?
.................................................................................................................... (ලකුණු 02යි)

**ස්ථානය 6**

(a) සපයා ඇති A, B, C හා D නියැදි, රෙදි නිෂ්පාදනයට අනුව අයත් වන කාණ්ඩ **දෙක** නම් කරන්න.
(i) ...................................................................... (ii) ................................................................ (ලකුණු 02යි)

(b) A, B, C හා D රෙදි නියැදි ඉහත කාණ්ඩ දෙකට වර්ග කර දක්වන්න.

(i) ....................................................................................................................

(ii) .................................................................................................................... (ලකුණු 02යි)

ස්ථානය 7

(a) නියැදියෙහි දැක්වෙන වියමන කුමක්ද?.
........................................ (ලකුණු 02යි)

(b) මෙම වියමන සහිත රෙදි හඳුනා ගත හැකි විශේෂ ලක්ෂණය කුමක්ද?
........................................ (ලකුණු 02යි)

ස්ථානය 8

(a) රෙදි නියැදි අතුරින් ආරෝපණය (ඇප්ලික්) කිරීමට වඩාත් සුදුසු රෙදි වර්ගයේ නම හා අක්ෂරය ලියන්න.
........................................ (ලකුණු 02යි)

(b) රෙදි නියැදි අතුරින් කෘත්‍රිම කෙඳිවලින් නිෂ්පාදිත රෙදි වර්ගයේ නම හා අක්ෂරය ලියන්න.
........................................ (ලකුණු 02යි)

ස්ථානය 9

(a) මෙම රෙදිකැබැල්ලෙහි දම්වැල් මැස්මෙන් මැස්ම තුනක් මසා නිම කරන්න. (ලකුණු 04යි)

ස්ථානය 10

(a) නිදර්ශකය සඳහා යොදා ගෙන ඇති මෝස්තර ගැන්වීමේ ක්‍රමය කුමක්ද?
........................................ (ලකුණු 02යි)

(b) මෙම ක්‍රමයේ ප්‍රධාන පියවර **දෙකක්** ලියන්න.
(i) .................... (ii) .................... (ලකුණු 02යි)

ස්ථානය 11

(a) A හා B නම් කරන්න.
A .................... B .................... (ලකුණු 02යි)

(b) B හි කෘත්‍යය ලියන්න.
........................................ (ලකුණු 02යි)

ස්ථානය 12

(a) A හා B මගින් පෙන්නුම් කරන කොටස් නම් කරන්න.
A .................... B .................... (ලකුණු 02යි)

(b) B මගින් සිදු කරන ප්‍රධාන කාර්යය ලියන්න.
........................................ (ලකුණු 02යි)

ස්ථානය 13

(a) දී ඇති නිදර්ශකය නම් කරන්න.
........................................ (ලකුණු 02යි)

(b) එහි ඖෂධීය වටිනාකමක් සඳහන් කරන්න.
........................................ (ලකුණු 02යි)

ස්ථානය 14

(a) දී ඇති නිදර්ශක හඳුනාගෙන නම් කරන්න.
A .................... B .................... (ලකුණු 02යි)

(b) A හා B වල පෝෂණීය වැදගත්කම වෙන් වෙන්ව සඳහන් කරන්න.
A ........................................
B ........................................ (ලකුණු 02යි)

ස්ථානය 15

(a) නිදර්ශකයෙන් දැක්වෙන්නේ ආහාරවල අඩංගු පෝෂ්‍ය පදාර්ථයක් හඳුනා ගැනීම සඳහා කරන ලද පරීක්ෂණයක ප්‍රතිඵලයකි. මෙම පරීක්ෂණය මගින් හඳුනාගත හැකි පෝෂ්‍ය පදාර්ථය කුමක්ද?
........................................ (ලකුණු 02යි)

(b) පරීක්ෂණය සඳහා භාවිත කරන ලද ප්‍රතිකාරය නම් කරන්න.
........................................ (ලකුණු 02යි)

## ස්ථානීය පරීක්ෂණය සඳහා යෝජිත නිදර්ශක

**1.** දිග අඟල් 8ක් පමණ හා පළල අඟල් 1ක් පමණ වන කළු පැහැ පටි තිරු 6 ක් සපයන්න.

**2.** මෝස්තර කපන ලද ටයිල්, A ලෙසත්, ඔප නොදැමූ ටයිල් හා ග්‍රැනයිට් B ලෙසත්, දිලිසෙන ටයිල් C ලෙසත් නම් කර තබන්න.

**3.** කොත්මල්ලි A ලෙසත්, සූදුරු B ලෙසත්, මහදුරු C ලෙසත් නම් කර තබන්න.

**4.** පිසූ සව් නියැදියක් සපයා තබන්න.

**5.** හොඳින් රන්වන් දුඹුරු පැහැ වූ මාළු පාන් ගෙඩියක් සපයා තබන්න.

**6.** එකිනෙකට වෙනස් ලෙස වියන ලද රෙදි නියැදි දෙකක් හා ගොතන ලද රෙදි නියැදි දෙකක් A, B, C හා D ලෙස නම් කර තබන්න.

**7.** හීරි වියමන සහිත සැබෑ රෙදි නියැදියක් හා අත් කාචයක් සපයන්න.

**8.** පොප්ලින් A ලෙසත්, නයිලෝන B ලෙසත්, රෙයෝන් C ලෙසත්, වොයිල් D ලෙසත් වන පරිදි රෙදි නියැදි A, B, C හා D ලෙස නම් කර තබන්න.

**9.** ඉඳිකටු, නූල්, රෙදි කැබැලි සහ කතුරක් තබන්න.

**10.** ගැටපඬු ක්‍රමයෙන් අලංකාර කර ඇති ලේන්සුවක් තබන්න.

**11.** කෙවෙනිය (plain socket) හා ඌනිත කෙවෙනිය (reducing socket) A හා B ලෙස නම් කර තබන්න.

**12.** සිගිති පරිපථ බිඳිනයක් හා ශේෂ ධාරා පරිපථ බිඳිනයක් A හා B ලෙස නම් කර තබන්න.

**13.** කෝමාරිකා ශාක පත්‍රයක් තබන්න.

**14.** රතු කැකුළු සහල් හා තම්බපු නාඩු සහල් A හා B ලෙස නම් කර තබන්න.

**15.** පොල්තෙල් ස්වල්පයක් පරීක්ෂණ නළයකට දමා සුඩාන් III ද්‍රාවණය යොදා හොඳින් සොලවා තබන්න.

## B කොටස : ආහාර හා පෝෂණය

මෙම කොටස ප්‍රායෝගික ක්‍රියාකාරකම් **දෙකකින්** සමන්විත වේ. ඒ සඳහා කාලය පැය **02යි මිනිත්තු 30කි**. මෙම ක්‍රියාකාරකම් දෙක සඳහා ලකුණු **140ක්** හිමි වේ.

මෙම කොටසේ දී I කාණ්ඩයෙන් හා II කාණ්ඩයෙන් එක බැගින් ප්‍රායෝගික ක්‍රියාකාරකම් දෙකක් අහඹු ලෙස තෝරා ගත යුතු ය. එම තෝරා ගත් ආහාර වර්ග දෙක නියමිත කාලය තුළ දී එක් අයකුට ප්‍රමාණවත් ලෙස සකස් කර සුදුසු පරිදි පිළිගැන්වීම හා ස්ථානය යථාවත් කිරීම කළ යුතු වේ.

**ලකුණු ලබා දීමේ නිර්ණායක**

▲ ආහාර වර්ග දෙක සඳහා ම
- අමුද්‍රව්‍ය තේරීම — ලකුණු - 10
- උපකරණ තෝරා ගැනීම — ලකුණු - 10

▲ **I කාණ්ඩයේ ආහාර වර්ගය සකස් කිරීම**
- පිළියෙල කිරීමේ නිවැරදි ශිල්පීය ක්‍රම නිවැරදිව අනුගමනය කිරීම/ පිසීම — ලකුණු - 40
- රසය හා පෙනුම — ලකුණු - 20

▲ **II කාණ්ඩයේ ආහාර වර්ගය සකස් කිරීම**
- පිළියෙල කිරීමේ නිවැරදි ශිල්පීය ක්‍රම නිවැරදිව අනුගමනය කිරීම/ පිසීම — ලකුණු - 20
- රසය හා පෙනුම — ලකුණු - 20

▲ ආහාර වර්ග දෙක සඳහා ම
- පිළිගැන්වීම — ලකුණු - 10
- යථාවත් කිරීම — ලකුණු - 10

B කොටස සඳහා මුළු ලකුණු 140

**I හා II කාණ්ඩයේ ආහාර වර්ගවලින් කොටසක් පහත දැක්වේ.**

| I කාණ්ඩය | II කාණ්ඩය |
|---|---|
| විශේෂ බත් වර්ගයක් | රොටි වර්ගයක් |
| කිරිබත් වර්ගයක් | සම්බෝල වර්ගයක් |
| පොංගල් බත් | බිත්තර පිසීම |
| තෝසේ | පලා මැල්ලුමක් |
| ඉඳි ආප්ප | සලාද වර්ගයක් |
| සේවරි පිට්ටු | මයෝනීස් සලාද වැසුම |
| උප්පුමා | පලතුරු සලාද |
| පේස්ට්‍රි වර්ගයක් | සුප් වර්ගයක් |
| ඝන පිටි මෝලියෙන් සකස් කළ ආහාරයක් | රයිතා |
| දියාරු පිටි මෝලියෙන් සකස් කළ ආහාරයක් | කොළ කැඳ වර්ගයක් |
| සැන්ඩ්විච් වර්ගයක් | පලතුරු ස්ටූ |
| කට්ලට් | පලතුරු බීම |
| (ඉස්සෝ, මාළු, මස්) ව්‍යංජනයක් | උණුසුම් පාන වර්ගයක් |
| ස්ටූ වර්ගයක් | ජෙලි |
| මෝජු වර්ගයක් | අයිස් කෝපි |
| අච්චාරු වර්ගයක් | මිල්ක් ෂේක් |
| චට්නි වර්ගයක් | ෆලූඩා |
| චොප්සි | ලැසී |
| ලඩ්ඩු | |
| කේසරි | |
| මුරුක්කු | |
| කේක් වර්ගයක් | |
| දේශීය රසකැවිලි වර්ගයක් | |
| ටොෆි වර්ගයක් | |
| පුඩිං වර්ගයක් | |
| ජෑම් වර්ගයක් | |

**සටහන**

★ බත් වර්ග - නාසීගුරන්, ෆ්‍රයිඩ් රයිස්, කහ බත්,

★ රොටි වර්ග - එළවළු රොටි, බිත්තර රොටි

ආදි ලෙස ආහාර වර්ගය ලබා දේ.

* * *